ලේඛ අංක 1/2001
බන්ධව පැහැදිලි කිරීම

මගේ අංකය: බප/සසේකො/ලේ/නිජ/2001
සමුපකාර සේවක කොමිෂන් සභාව,
බස්නාහිර පළාත
2001.06.27

ස්නාහිර පළාතේ සියලුම සමුපකාර සමිති
භාපතිවරුන් වෙත,

**බස්නාහිර පළාතේ සමුපකාර සේවක වැටුප් ප්‍රතිශෝධනය - 2001**

බස්නාහිර පළාතේ සමුපකාර සේවකයන්ගේ වැටුප් ප්‍රතිශෝධනය කරමින් ම විසින් නිකුත් කරන ලද අංක 1/2001 දරණ චක්‍රලේඛය නිකුත් කිරීමෙන් පසු සමිති විශාල සංඛ්‍යාවකින් මා වෙත ලැබුන විමසීම් හා ඒවාට අදාල පිළිතුරු පහත සඳහන් කර එවමි.

01. කිසියම් වැටුප් තලයක උපරිමයට පැමිණ සිටින සේවකයකු මෙතෙක් රැඳී සිටීමේ වාසිය ලබා ගෙන නැත්නම් ඔහුගේ වැටුප නව වැටුපට පරිවර්තනය කිරීමේදී උපයා ගත් වැටුප සොයා ගන්නේ කෙසේද?

පහත සඳහන් සමීකරණය අනුව කටයුතු කිරීමෙන් මෙය විසඳා ගත හැකි වනු ඇත.

$$\frac{\text{වැටුප් වර්ධනයේ අගය} \times \text{උපරිමයට පැමිණි දින සිට 2001.03.31 වන දින දක්වා තිබෙන දින ගණන}}{1095}$$

02. කිසියම් වැටුප් තලයක උපරිමයට පැමිණි සේවකයකු පළමුවන රැඳී සිටීමේ වැටුප් වර්ධනය ලබා ගැනීමෙන් පසුව 02 හෝ 03 හෝ 04 හෝ 05 වන රැඳී සිටීමේ වැටුප් වර්ධක ලබා ගැනීමට පෙර වැටුප පරිවර්තනය කිරීමේදී උපයා ගත් වැටුප සොයා ගන්නේ කෙසේද?

පහත සඳහන් සමීකරණය අනුව කටයුතු කිරීමෙන් මෙය විසඳා ගත හැක.

$$\frac{\text{වැටුප් වර්ධනයේ අගය} \times \text{රැඳී සිටීමේ අවසාන වාසිය ලබා ගත් දින සිට 2001.03.31 දින දක්වා දින ගණන}}{730}$$

03. කිසියම් වැටුප් තලයක උපරිමයට පැමිණ රැඳී සිටීමේ වාසි 05 ම ලබා ගැනීමෙන් පසු තවදුරටත් වැටුප් වර්ධක ලබා ගැනීමට හිමිකම් නොමැති අයගේ වැටුප නව වැටුපට පරිවර්තනය කරන්නේ කෙසේ ද? එම අයටත් උපයාගත් වැටුපක් හිමි ද?

මේ වැනි අයට උපයා ගත් වැටුප් වර්ධක වාසිය හිමි වන්නේ නැත.

04. කිසියම් විනය නියෝගයක් මත වැටුප් වර්ධක විලම්භනය කර හෝ ආකාරයකින් අත් හිටවූ සේවකයන්ගේ වැටුප නව වැටුපට පරිවර්තනය කිරීමේදී ගත් වැටුප් වර්ධක වාසිය ලබාගත හැකි ද?

මෙවැනි සේවකයන්ට උපයා ගත් වැටුප් වර්ධක වාසිය ලබා ගැනීමට නැත. එහෙත් පසු අවස්ථාවක එම අත් හිටවූ වැටුප් වර්ධක තීරණය කළහොත් උපයාගත් වැටුප් වර්ධක වාසිය ද ගෙවිය යුතු ය.

05. කොන්ත්‍රාත් පදනම මත සේවයේ යොදවා සිටින සේවකයන්ට මෙම නව වැටුප් අදාල කර ගත හැකි ද?

කොන්ත්‍රාත් පදනම මත සේවයේ යොදවන අයට මෙම නව වැටුප් අදාල කර ගත නොහැක. ඔවුන්ට අදාල වන්නේ කොන්ත්‍රාත් ගිවි සඳහන් වැටුප ය. එය සංශෝධනය කිරීමට ද අවසර දෙනු නොලැබේ

06. දෛනික වැටුප් ලබන සේවකයන්ට මෙම වැටුප් ක්‍රමය අදාල කර ගන්නේ කෙසේ

අදාල තනතුර සඳහා නියම කර ඇති වැටුපෙන් 1/26 ක් දෛනික වශයෙන් සලකා වැටුප ගෙවිය යුතු ය.

07. යැපීම් දීමනා ගෙවීමේදී පැය 24 ක කාලයක් කාර්යාලයෙන් බැහැරව රාජකාරි ලද නිලධාරියකුට 25% ක අමතර දීමනාව හිමි නැත්ද?

පැය 24 ඉක්මවා කිසියම් කාලසීමාවක් එක දිගටම කාර්යාලයෙන් බැහැ රාජකාරියේ යෙදී සිටින නිලධාරීන්ට පැය 24 ඉක්මවූ වහාම එක් එක් 24 ට 25% ක අමතර දීමනාවක් ලබා ගැනීමට හිමිකම් තිබේ.

08. 2001.04.01 දින සිට 2001.12.31 දින දක්වා කාලය තුල වැටුප් ව ගෙවීමට නියමිතව තිබූ සේවකයන්ට නව වැටුප් ක්‍රමය ක්‍රියාත්මක වීමත් සමගම වර්ධක දිනයන්හි වෙනස් වීමක් සිදුවන්නේ ද?

2001.04.01 වන දින සිට 2001.12.31 දින දක්වා වැටුප් වර්ධක යෙදී තිබෙන සේවකයන්ට එම දිනයන්හි එම වැටුප් වර්ධක ලබා ගැ හිමිකම් නොමැත. 2001.03.31 දිනෙන් පසු ඔවුන්ගේ මීළඟ ව වර්ධක දිනය වන්නේ 2002.01.01 වනදා ය. ඉන් ඉදිරියට වර්ෂයකම ජනවාරි මස 01 වන දිනය වැටුප් වර්ධක දිනය වශ සැලකිය යුතු ය.

09. 1971 – 76 දක්වා සේවයට බඳවා ගත් උපාධිධාරීන්ට සහ 2000 වර්ෂයේදී සේවයට බඳවා ගත් උපාධිධාරී අභ්‍යාසලාභීන්ට 05/2000 දරණ චක්‍රලේඛයේ සඳහන් අතිරේක දීමනාවන් ලබා ගැනීමට හිමිකමක් නැත්ද?

1971 සිට 1976 දක්වා සේවයට බඳවා ගත් උපාධිධාරීන්ට සහ 2000 වර්ෂයේ සේවයට බඳවා ගත් උපාධිධාරී අභ්‍යාසලාභීන්ට විශේෂ වැටුප් ක්‍රම දෙකක් අනුමත කර ඇති අතර එම වැටුප් ක්‍රමයේ සඳහන් වැටුපට අමතරව සමුපකාර සේවක කොමිෂන් සභාව විසින් නිකුත් කර ඇති අංක 5/2000 දරණ චක්‍රලේඛයේ සඳහන් අතිරේක දීමනාව ලබා ගැනීමට හිමිකම් තිබේ. එම වැටුප ඔවුන්ට පෞද්ගලිකව ගෙවනහොත් එම දීමනාව ද ලබා ගත හැකි ය.

10. පඩිපාලක සභා වැටුප් ක්‍රමය යටතේ වැටුප් ලබන සේවකයන්ට නව වැටුප් ක්‍රමය අදාල කර ගන්නේ කෙසේද?

**පඩිපාලක සභා** වැටුප් ක්‍රමය යටතේ වැටුප් ලබන සේවකයන්ගේ වැටුප **අංක 2/96** චක්‍රලේඛය අනුව ප්‍රථමයෙන්ම ගැලපීමක් කළයුතු අතර එසේ **කිරීමෙන් පසුව** පමණක් නව වැටුප් ක්‍රමයට පරිවර්තනය කළ හැකි ය.

11. කිසියම් සේවකයකු තමන් දරන තනතුරට වඩා උසස් තනතුරක පූර්ණකාලීනව වැඩ බලන විට වැඩ බැලීමේ වැටුප වශයෙන් ගෙවිය යුත්තේ කවර මුදලක් ද?

උසස් තනතුරේ ආරම්භක වැටුපෙන් 1/2 ක් සහ ස්ථිර තනතුරේ ආරම්භක වැටුපෙන් 1/2 ක් ද ස්ථිර තනතුරේ උපයා ගත් වැටුප් වර්ධක අගයන් සියල්ලම ද එකතු කර මෙම සේවකයාගේ වැඩ බලන වැටුප වශයෙන් ගෙවිය යුතු ය.

12. කිසියම් සේවකයකු තමා දරන තනතුරට අමතරව එම තනතුරට උසස් හෝ සමාන තනතුරක වැඩ බැලීම සිදු කරන විට වැඩ බැලීමේ වැටුප වශයෙන් ගෙවියයුත්තේ කවර මුදලක් ද?

වැඩ බැලීම කරනු ලබන්නේ උසස් හෝ සමාන තනතුරක නම් එසේ වැඩ බලන තනතුරේ ආරම්භක වැටුපෙන් 1/4 ක් වැඩ බලන වැටුප වශයෙන් තමන් දරන නිත්‍ය තනතුරේ වැටුපට අමතරව ලබා ගැනීමට ඔහුට හිමිකම් තිබේ.

13. කිසියම් සේවකයකු තමන් දරන තනතුරට පහත් තනතුරක වැඩ බැලීම කරනු ලබන්නේ නම් වැඩ බැලීමේ වැටුපක් ලබා ගැනීමට හිමිකම් නැත්ද?

මේ වැනි සේවකයන්ට වැඩ බැලීමේ වැටුපක් ලබා ගැනීමට හිමිකම් නැත

14. කිසියම් සේවකයකු තනතුරු කිහිපයක වැඩ බැලීම කරනු ලබන විට වැඩ බැලීමේ වැටුප ඒ සියලුම තනතුරු සඳහා ලබා ගැනීමට හිමිකම තිබේද?

තනතුරු කිහිපයක වැඩ බැලීම කරනු ලැබුවත්, ලබා ගත හැක්කේ එක් තනතුරක් වෙනුවෙන් වැඩ බැලීමේ වැටුපක් පමණි. එය ඉහත 12 යටතේ විස්තර කරන ආකාරයේ වැටුපක් විය යුතු ය.

15. මාසික වැටුප් පදනම් කර ගත් වැටුප් චක්‍රයක් සමුපකාර සේවක කොමිෂන් සභාව විසින් පිළියෙල කර සමුපකාර සමිතිවලට ලැබෙන්නට සැලැස්විය හැකි ද?

මෙම ලිපියට එබඳු චක්‍රයක් අමුණා තිබේ.

කේ. එස්. විමලවීර,
ලේකම්,
සමුපකාර සේවක කොමිෂන් සභාව,
බස්නාහිර පළාත.